චක්‍රලේඛ අංකය: 2005/4

මගේ අංකය: පළාත්/ඉකො/ආ1/චක්‍රලේඛ
පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව,
තැ.පෙ.46,
කුරුණෑගල.

2005.11.02

09 NOV 2005

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

ප්‍රදානපත්‍ර හිමිකරුගේ අභාවයෙන් පසු කලත්‍රයාට ප්‍රදාන පත්‍රයේ හිමිකම පැවරීම.

---

ඉඩම සංවර්ධන ආඥා පනතේ 19 (4) වගන්තිය යටතේ ඉඩම් හිමිකරුවනට ප්‍රදාන පත්‍රයක් නිකුත් කිරීමෙන් අනතුරුව ප්‍රදානපත්‍ර හිමිකරු ජීවත්ව සිටින කාළය තුල අනුප්‍රාප්තිකයෙකු වශයෙන් කලත්‍රයා නම් නොකර මියගිය අවස්ථාවලදී ඉඩම් සංවර්ධන ආඥා පනතේ 48 (ආ) වගන්තිය හා එහි විධිවිධාන වලට අනුව කලත්‍රයා ඉඩම සඳහා අනුප්‍රාප්ති වීමට හිමිකම ලබයි.

02. සමහර ප්‍රාදේශිය ලේකම් කාර්යාල වලින් මෙවැනි අවස්ථාවලදී කලත්‍රයාගේ ජීවිත භුක්තියට යටත්ව 3 වන උපලේඛණයේ ඥාතීන් අතරින් කෙනෙක් සඳහා මුල් අයිතිය නම් කරන අතර, මෙය නිත්‍යානුකූල නොවන බව අභියාචනාධිකරණ නඩු අංක සීඒ 931/2000 දරණ නඩු තීන්දුව අනුව තහවුරු වී ඇත. එබැවින් මින් ඉදිරියට එම නඩුවේ තීන්දුව පූර්වාදර්ශයක් කර ගනිමින් කලත්‍රයාට අනුප්‍රාප්තිය නම් කිරීම සම්බන්ධව ගැටළු විසඳන ලෙස මෙයින් උපදෙස් දෙමි.

රංජිත් වෛද්‍යතිලක,
පළාත් ඉඩම් කොමසාරිස් (වයඹ).

පිටපත්:-

1. ඉඩම් කොමසාරිස් ජනරාල් , කොළඹ - දැ.පි.
2. ප්‍රාදේශීය නිලධාරී (ඉඩම්) - දැ.පි.
3. වැඩසටහන් සහකාර (ඉඩම්) - දැ.පි.
4. ජනපද නිලධාරී /ඉ.නි. - දැ.පි.
5. ක්ෂේත්‍ර උපදේශක - දැ.පි.